තනතුරු - ඇබෑර්තු

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

කම්කරු විනිශ්චය සහා සහකාර ලේකම් තනතුර සඳහා බඳවා ගැනීම - 2026

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ කම්කරු විනිශ්චයාධිකාරයන් හි පුරප්පාඩුව පවතින සහකාර ලේකම් තනතුරු 13 ක් සඳහා බඳවා ගැනීමට සුදුසුකම් සපුරාලන ඒකාබද්ධ සේවයට අයත් කළමනාකරණ සේවා නිලධාරි I ශ්‍රේණියේ නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශ නිල වෙබ් අඩවියෙහි පල කර ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර **ලේකම්, කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය, අංක 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම් පස ඉහළ කෙලවරේ **"කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලයේ කම්කරු විනිශ්චය සභා සහකාර ලේකම් තනතුර සඳහා බඳවා ගැනීම"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

අයදුම්පත් කැඳවන අවසාන දිනය 2026.11.23 දින වේ.

අයදුම්පත් යොමු කළ හැක්කේ ඒකාබද්ධ සේවයේ නියුතු කළමනාකරණ සේවා නිලධාරි I ශ්‍රේණියේ නිලධාරින්ට පමණි.

සටහන - ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතු ය.

01. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම් විසින් අයදුම්පත් කැඳවා, එම අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා බඳවා ගැනීම් සිදු කරනු ලබයි.

02. **තනතුරේ ස්වභාවය -**
මෙම තනතුර ස්ථීර, විශ්‍රාම වැටුප් සහිත වේ.

03. **වැටුප් පරිමාණය -**
MN 2 – 2025 - රු.48,470-10X540-11X630-10X1,010-10X1,190 – රු. 82,800/-

04. **මූලික සුදුසුකම් -**

ඒකාබද්ධ සේවයට අයත් කළමනාකරණ සේවා නිලධාරි I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

05. **තෝරා ගනු ලබන ක්‍රමය -**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු මත කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු වලට බඳවා ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීමේ පරිපාටිය, පුරප්පාඩු පවතින කම්කරු විනිශ්චයාධිකාරයන්ගේ තොරතුරු හා ආදර්ශ අයදුම්පත්‍රය අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ (www.moj.gov.lk) පළ කර ඇත.

06. ඉල්ලුම් පත්‍රයට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුලත් කළ යුතු ය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම් පතට අනුව සැකසිය යුතුය. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

සියලුම අයදුම්පත් තමන් දැනට සේවයේ නියුතු ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතු වේ.

07. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් පොදු නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

08. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍යය නිවේදනය අනුව කටයුතු කළ යුතු ය.

ජනාධිපති නීතිඥ අයෙෂා ජීනසේන,
ලේකම්.
අධිකරණ සහ ජාතික
ඒකාබද්ධතා අමාත්‍යාංශය.

2026 ඔක්තෝබර් මස 07 වැනි දින,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය,
අංක 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED